www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව පැල්පත් ඉවත් කිරීමේ මෙහෙයුම් පුලුල් කරයි

## Sri Lankan government plans extensive slum clearance evictions

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

2010 ජූනි 07

ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුව එහි කොලඹ නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාවට දැමීමත් සමග කොලඹ පැල්පත් වැසියන් දහස් ගනනක් ඔවුන්ගේ නිවාස හා ජීවන මාර්ගයන් අහිමි වීමේ අවදානමකට මුහුන දී සිටිති. අගනගරය "දකුනු ආසියාවේ මූල්‍යමය හා වානිජ මධ්‍යස්ථානය" බවට පරිවර්තනය කිරීම අරමුනු කර ගත් සැලැස්ම විදෙස් ආයෝජකයන් හා සංචාරකයින් ආකර්ශනය කරගැනීමේ පුලුල් සැලස්මක කොටසකි.

මෙම යෝජනාව 1999 වසරේදී නාගරික සංවර්ධන අධිකාරිය (යූඩීඒ) විසින් සැලසුම් කල නමුත් ජනතා විරෝධය සහ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ)ට එරෙහිව එකල පැවැති යුද්ධය හේතුවෙන් කල් දමනු ලැබීය. සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ආන්ඩුවේ අභිලාෂය 2008 වසරේ නිල ගැසට් නිවේදනයකින් දන්වා සිටියේය.

පසුගිය මැයි මාසයේ එල්ටීටීඊයේ පරාජයෙන් අනතුරුව "ජාතිය ගොඩනැගීමට" "ආර්ථික යුද්ධයක්" දියත් කිරීමට ඔහු සූදානම් වන බව රාජපක්ෂ ප්‍රකාශ කලේය. ඔහු, පූර්වයෙන් සිවිල් අධිකාරියක්ව පැවති යූඩීඒ ආයතනය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත්කල අතර ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යූඩීඒ සභාපතිවරයා ලෙස පත් කලේය.

සන්නද්ධ මිලිටරියේ සහ පොලිසියේ සියගනනක් මැයි 7වෙනි දින කොලඹ කොම්පඤ්ඤ වීදියේ පවුල් 45ක් ඔවුන්ගේ නිවාසවලින් නෙරපා දමන විට යූඩීඒය මිලිටරිය යටතට පත් කිරීමේ අර්ථභාරය පැහදිලි විය. ආරක්ෂක අමාත්‍යාංශය එය විසින් "නීති විරෝධී ගොඩනැගීම්" යයි සඳහන් කල පැල්පත් කඩා දැමූ අතර කිලෝමීටර් 5ක් දුරින් පිහිටි ප්‍රදේශයක කුඩා ලී මඩු නිවාස අහිමි කලවුන්ට ලබා දුන්නේය. නිවෙස් හිමියන් ඒවා ප්‍රතික්ෂේප කලවිට වාර්ෂික කුලිය හා ප්‍රවාහනය වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් ඔවුන්ට දුන්නේය.

නිවෙස්වලින් පන්නා දැමීම් "වරාය සම්බන්ධිත හා බැංකු, මූල්‍යමය සහ රක්ෂනය යන අංශ" විසින් කරනු ලබන සංවර්ධනය සඳහා විශාල දිලිඳු වාසස්ථාන ප්‍රදේශයන් හිස්කරගැනීමේ පලමු පියවර ය. "නගරයේ සමස්ත ජනගහනයෙන් සියයට පනහක් අඩු ආදායම්ලාභීන් වන අතර නගරයේ සමස්ත භූමියෙන් සියයට 11ක ප්‍රතිශයක් ආවරනය කරගනිමින් වාසස්ථාන ඔවුහු පිහිටුවා ගෙන සිටිති" යැයි අගනගරය සම්බන්ධ යූඩීඒ සැලසුම සඳහන් කර ඇත. දිලිඳු වැසියන් පදිංචිව සිටින හෙක්ටයාර 390ක භූමිය "මුදා ගැනීම" යූඩීඒහි අරමුනයි.

භූමිය සංවර්ධනය කිරීම කවරාකාරයෙන් සිදු කෙරෙන්නේ දැයි යූඩීඒ සැලසුම විස්තර නොකරන නමුදු විශාල බිම් කොටස් ප්‍රමානයක් නියතලෙසම ප්‍රධාන ආයෝජකයන්ට හා දේපල සංවර්ධකයන්ට පවරා දෙනු ඇත. මධ්‍යම කොලඹ ඉඩම් වෙලඳාම ලාභදායි ව්‍යාපාරයකි. එක් පර්චසයක් හෙවත් වර්ග මීටර් 25ක බිම්කඩක් වර්තමානයේ දී රුපියල් මිලියනයේ සිට පිහිටි තැන අනුව රුපියල් මිලියන 8 දක්වා මිලකට අලෙවි කෙරේ.

ඇල ඉවුරු හා කැලනි ගං මිටියාවත ඇතුලු විවිධ තැන්වල පැල්පත්වල පදිංචිව සිටින පවුල් දස දහස් ගනනක් පීඩාවට පත් වෙනු ඇත. පැල්පත් බොහෝමයක් 1948 ශ්‍රී ලංකාව නිදහස ලැබීමටත් පෙර කාලයේ සිට පැවතෙන නමුත් ඒවායේ ව්‍යාප්තිය 1977 දී ක්‍රියාවට දැමූ විවෘත - ආර්ථික වැඩපිලිවෙත මඟින් වේගවත් කෙරින.

2004 වසරේ කොලඹ මහනගර සභා සමීක්ෂනයකට අනුව, කොලඹ නගරයේ මිලියන භාගයක මිනිසුන් සංඛ්‍යාවක් අඩංගු කරගත් පවුල් 72,612කගේ නිවාසවලින් සමන්විත දිලිඳු වාසස්ථාන 1,614ක් පිහිටා තිබුනේය. ඔවුන්ගේ ලමුන්ට අධ්‍යාපනය ලැබීමට ප්‍රමානවත් පහසුකම් තිබුනේ නැත. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුත් පවුලකට අයත් වූ බිම් ප්‍රමානය වර්ග අඩි 350කට වඩා අඩු විය. ඔවුන් පරිහරනය කලේ පොදු වැසිකිලි හා ජල කරාම ය.

එම නිවෙස් හිමියන්ගෙන් සියයට 45ක් නොඑසේනම් පවුල් 34,925ක්ම නිරතව සිටියේ නුපුහුනු, තාවකාලික රැකියාවල ය. ස්ථිර ආදායම් මාර්ගයක් ඇත්තේ සියයට 12ක් හෙවත් පවුල් 9,314කට පමනකි. බොහෝ දෙනෙකු කුඩා කර්මාන්ත ශාලාවල දෛනික කම්කරුවන් වසයෙන්ද, පවිත්‍රකරනය හෝ කුඩා ත්‍රී-රෝද ටැක්සි රථ එලවීම වැනි විවිධ ජීවිකාවල නිරත වෙති. සෙසු අය පදික වෙලෙඳුන් වසයෙන්ද මැහුම් වැඩ කිරීමෙන් හෝ ඉවතලන යකඩ, පත්තර හා බෝතල් එකතු කිරීමෙන් සුලු මුදලක් උපයා ගනිති.

එම සමීක්ෂනයෙන් පසුව තවත් මිනිසුන් බොහෝ ප්‍රමානයක් දිවයිනේ ගම්බද ප්‍රදේශයන් තුල වැඩෙන විරැකියාව හා දරිද්‍රතාව විසින් කොලඹට තල්ලු කර එවා තිබේ. 2004 දෙසැම්බර් මස රටේ නැගෙනහිර හා දකුනු වෙරල තීරය වනසා දැමූ ආසියානු සුනාමියෙන් අනතුරුව සියයට 8කට ආසන්න ප්‍රතිශතයකින් පැල්පත් නිවෙස් හිමියන් සංඛ්‍යාව ඉහල නැගුනි. ආන්ඩුව පොරොන්දු වුනත් දුකට පත්වූවන් බොහෝමයකට නව වාසස්ථාන සහ රැකියා අවස්ථාවන් උදාකර දී නොමැත.

පැල්පත් වැසියන්ට කුමක් සිදුවනු ඇත්දැයි *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විමසූ විට යූඩීඒ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසන්න සිල්වා කියා සිටියේ "ඔවුන් කොලඹින් පිටත පදිංචි වීමට කැමතියි නම් ආන්ඩුව ඔවුන්ට සුදුසු වාසස්ථාන හෝ වන්දි පිරිනමනු ඇති" බවයි. කොලඹ නගර මාඉමේ ව්‍යාපෘති තුනක් පිලිබඳවත් හෙතෙම සඳහන් කලේය.

කෙසේවෙතත් මෙම ව්‍යාපෘති මගින් යූඩීඒය විසින් අවතැන් කරවනු ඇති දස දහස් ගනනක් මිනිසුන්ට නිවාස සැපයීමක් නොවනු ඇත. මෙතෙක් ගොඩ නගා ඇත්තේ - සහශ්‍රපුර (මිලේනියම් සිටි) හා දෙමටගොඩ - නව නිවාස සංකීර්න දෙකක් පමනි. සහශ්‍රපුර නිවාස සංකීර්නය 2001-2002 වසරවල ගොඩනැගූ අතර පැල්පත් නිවහන් ප්‍රදේශ 16ක පවුල් වෙනුවෙන් ඇත්තේ නිවාස ඒකක 676ක් පමනි. මෙම නිවාස ඒකක ප්‍රමානවත් නොවන බවත් වැඩිප්‍රමානයක් පිලිසකර කල යුතු තත්වයේ පවතින බවත් නිවැසියෝ මැසිවිලි නඟති. මෙම පවුල් වෙන තැනක පදිංචි කරවීමෙන් රුපියල් මිලියන 900ක් (ඩොලර් මිලියන 8ක) අගනා අනර්ග ඉඩම් හෙක්ටයාර 7ක් නිදහස් කරගැනීමට හැකිවූයේ යැයි ආන්ඩුව වහසිබස් දෙඩුවේය.

පදිංචිකරුවන් ඉඩම් "නීති විරෝධීව අල්ලාගෙන සිටි" බව සඳහන් කරමින් ආන්ඩුව මෑත සිදුකල නිවෙස්වලින් පන්නා දැමීම් සාධාරනීකරනය කලේය. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මුඩුක්කු "ඇසට අප්‍රිය දසුනක්" ලෙස හංවඩු ගැසුවේය. කෙසේවෙතත් දශක ගනනාවක් තිස්සේ බලයට පත් ආන්ඩු පැල්පත් තිබෙන්නට නිහඬව ඉඩහැරි අතර පොදු පහසුකම් සහිත සුදුසු නිවාස ලබාදීමට කිසිවක් නොකලේය. ඉඩම් විකිනීමට එයට අවශ්‍ය නිසා මේ මොහොතේදී පමනක් රාජපක්ෂ ආන්ඩුව "නීති විරෝධී" ඉදිකිරීම් පිලිබඳ කාරනය මතුකරමින් සිටී.

පසුගිය මාසයේ නෙරපා දැමීම්වලින් පසුව ආන්ඩුව තවත් නිදහසට කරුනක් ගොතා තිබේ. මොරසූරන වැසි මැද්දේ නගරයේ ගංවතුර ගැලීම ගැන ආන්ඩුව පැල්පත් වැසියන්ට බැන අඩ ගැසීමට පටන් ගත්තේය. "ගංවතුර විනාශයන් මඟහරවා ගැනීමට ඇල ඉවුරු දෙපස පදිංචිව සිටින්නන් ඉවත් කරන ලෙස අදාල බලධාරීන්ට" ජනපති රාජපක්ෂ මැයි 18 වෙනිදින නියෝග කලේය.

පසුව වාරිමාර්ග සහ ජල සම්පත් කලමනාකරන අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා ගංගා ඉවුරු, වගුරු බිම් ආශ්‍රිතව සහ කොලඹ හා අනෙකුත් ප්‍රදේශවල සියලුම "අනවසර" පැල්පත් ඉවත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩපිලිවෙලක් නිවේදනය කලේය. පැල්පත් ගං වතුර ගැලීමේ "ප්‍රධාන හේතුව" බව කියා පෑ හෙතෙම නීති විරෝධී පදිංචිකරුවන්ට කිසිදු වන්දියක් නොගෙවන බව ප්‍රකාශ කලේය.

කොම්පඤ්ඤ වීදියේ නෙරපා දැමීම්වලින් අනතුරුව ජාතික ආරක්ෂාව සඳහා මාධ්‍ය මධ්‍යස්ථානය පහත සඳහන් ප්‍රකාශය නිකුත් කලේය: "ඊයේ දින [මැයි 7] සිදු කෙරුනු මැලේ වීදියේ ආරක්ෂක සේවා

පාසලකට අයත් ඉඩමෙන් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම මානුෂීය ආකාරයකින් සහ නීතිය හා යුක්තියේ පදනමක් මත සිදුකල බව රජය අවධාරනය කරයි.”

කොම්පඤ්ඤ වීදියේ පදිංචිකරුවන්ගේ තත්වය කෙරෙහි අනුකම්පා විරහිත මෙම නොතකා හැරීම අනෙකුත් පැල්පත් වැසියන්ට පමනක් නොව රජපක්ෂගේ "ආර්ථික යුද්ධයේදී" යොදාගනු ඇති විධික්‍රම පිලිබඳ සමස්තයක් වසයෙන් කම්කරු පන්තියටම අනතුරු ඇඟවීමකි. කොලඹ නගරයේ ප්‍රධාන නිශ්චල දේපල හිස්කිරීම හා විකිනීමේදී මෙන්ම ආන්ඩුව රාජ්‍ය වියදම් කැපීමට හා රාජ්‍ය දේපල පෞද්ගලීකරනය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් එල්ලවන පීඩනයට මුහුන දී සිටියි. කම්කරු පන්තියෙන් එල්ලවන මොනයම්ම හෝ විරුද්ධත්වයක් මැඩලීමට ආරක්ෂක බලකායන් යොදා ගැනීමේදී එය කිසිවිටෙක පසුබට නොවනු ඇත.

© www.wsws.org